// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2191/28 - 2020 සැප්තැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: BD/HE/LND/5/61.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2016/WS/311.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවින්න කෝරළයේ 55ඒ පල්ලෙගම ග්‍රාම නිලධාරී වසමේ වෙල්ලේවෙල ගමේ මැනුම්පති විසින් පිළියෙල කරන ලද අ.ග.සි. 18 අතිරේකය 6 පත්‍ර අංක 9 හි කැබලි අංක 256 සිට 258 දක්වා දැක්වෙන ඉඩම් අතරින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.9517ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි තුන (03).

01. **කැබලි අංක 256 - ඉඩමේ නම: පිටහැල්ලේපතන; ඉඩමේ විස්තර: ගෙවත්ත වතුර ටැංකියක කොටසක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2277**

*උතුරට*: කැබලි අංක 216, 218 සහ 258; *නැගෙනහිරට*: කැබලි අංක 258 සහ 257; *දකුණට*: කැබලි අංක 258 සහ 257; *බටහිරට*: කැබලි අංක 216.

02. **කැබලි අංක 257 - ඉඩමේ නම: පිටහැල්ලේපතන; ඉඩමේ විස්තර: ගෙවත්ත වතුර ටැංකියක කොටසක් වතුර ටැංකියක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: ඇටම්පිටිය වෙල්ලේවෙල, "ශ්‍යාමලී" නිවස හි පදිංචි උඩගම ලියනගේ රණසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1770**

*උතුරට*: කැබලි අංක 256; *නැගෙනහිරට*: කැබලි අංක 258 ; *දකුණට*: කැබලි අංක 258, 215 සහ 216; *බටහිරට*: කැබලි අංක 216 සහ 219

03. **කැබලි අංක 258 - ඉඩමේ නම: පිටහැල්ලේපතන; ඉඩමේ විස්තර: වතු ගෙවතු මාර්ගය සහ කඳුරු ආදිය; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 5.5470.**

*උතුරට*:—; *නැගෙනහිරට*:—; *දකුණට*:—; *බටහිරට*:—.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි, ඒ ඒ ඉඩම් කැබලි සඳහා පහත නියම කර ඇති වේලාවට හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| පරීක්ෂණ දින | වේලාව | කැබලි අංක |
|---|---|---|
| 2020.09.30 | පෙ. ව. 10.00 | 256, 257, 258 |

තව ද, 2020 සැප්තැම්බර් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එච්. පී. ඒ. ජී. අනුරුද්ධ,
ප්‍රාදේශීය ලේකම්,
හාලිඇල.

2020 අගෝස්තු මස 29 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
හාලිඇල.

09 - 414

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: එන්සීපී/ එම්ජී/එල් 2/පොදු/07/04.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/9/2010/IR/06
2015.0612 දින.

2017.06.07 දිනැති අංක 2022/22 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් කැබලි අංක දෙකක වෙනසක් පවතින බැවින් එය නිවැරදි කර සකස් කරන ලද ශුද්ධිපත්‍රිකාව පහත පළවේ.

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය කන්තලේ මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (01) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

උතුරුමැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 100 බිසෝබණ්ඩාරගම ග්‍රාම නිලධාරී වසමේ බිසෝබණ්ඩාරගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ කැ. සි. අංක 120056 කලාප අංක 11න් පසු අංක 03 දරන සැලසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර කරන ඉඩම් කැබලි:

01. **කැබලි අංක 173**

ඉඩමේ නම: මැදිරිගිරිය යාය; ඉඩමේ විස්තර: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය, අනවසරකරු - දිග්ගල්පුර පදිංචි කස්තුරි ආරච්චිගේ සමන්ත විජය කුමාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0246.

02. **කැබලි අංක 177**

ඉඩමේ නම: මැදිරිගිරිය යාය; ඉඩමේ විස්තර: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය, අනවසරකරු - දිග්ගල්පුර පදිංචි අසුරමුණි නෙල්සන් සිල්වා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1426.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 සැප්තැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00ට මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 සැප්තැම්බර් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම් සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

සී. එම්. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 415

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.